# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2162/10 - 2020 පෙබරවාරි මස 10 වැනි සඳුදා - 2020.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථාව

4 වන සංශෝධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019 ඔක්තෝබර් 22 දිනැති අංක 2146/22 , 2017 අගෝස්තු 17 දිනැති අංක 2032/33 සහ 2016 ජුනි 15 දිනැති අංක 1971/17 දරන අති විශෙෂ ගැසට් පත්‍ර මගින් සංශෝධිත 2014 සැප්තැම්බර් 19 දිනැති අංක 1880/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 ජනවාරි මස 31 වැනි දින.

| අනු අංකය | ඡේද අංක | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 1 | 05 | 05 වැටුප්<br>5.1 වැටුප් කේත අංකය<br>ජ්‍යෙෂ්ඨ විධායක SL - 03<br>විධායක SL - 01<br><br>5.2 වැටුප් පරිමාණ<br>ජ්‍යෙෂ්ඨ විධායක SL - 03<br>රු. 88,000 - 2700 X 12 - රු.120,400/=<br>විධායක SL - 01<br>රු. 47,615 - 1335 X 10 - 1630 X 8 - 2170 X 17 - රු. 110,895/= |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

<table>
<tr><th>අනු අංකය</th><th>ඡේද අංක</th><th>සංශෝධනය විය යුතු ආකාරය</th></tr>
<tr><td></td><td></td><td>5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර 2016.01.01 සිට 2020.01.01 දක්වා වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වේ.
<table>
<tr><th>ශ්‍රේණිය</th><th>ආරම්භක වැටුප් පියවර</th><th>ආරම්භක වැටුප් තලය (රු.)</th></tr>
<tr><td>III ශ්‍රේණිය</td><td>පියවර 01</td><td>රු.47,615/=</td></tr>
<tr><td>II ශ්‍රේණිය</td><td>පියවර 12</td><td>රු.62,595/=</td></tr>
<tr><td>I ශ්‍රේණිය</td><td>පියවර 20</td><td>රු.76,175/=</td></tr>
<tr><td>විශේෂ ශ්‍රේණිය</td><td>පියවර 01</td><td>රු.88,000/=</td></tr>
</table></td></tr>
<tr><td>2</td><td>6</td><td>SL - 03-2006 ලෙස සඳහන් සියළු ස්ථාන SL - 03-2016 ලෙස<br>SL - 01- 2006 ලෙස සඳහන් සියළු ස්ථාන SL - 01-2016 ලෙස ද සංශෝධනය කරනු ලැබේ.</td></tr>
<tr><td>3</td><td>6.3</td><td>ස්ථිර විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව ඉදිරියේදී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)</td></tr>
<tr><td>4</td><td>8</td><td>කාර්යක්ෂමතා කඩඉම යටතේ ඇතුළත් කර ඇති වගුවේ තුන්වන කාර්යක්ෂමතා කඩඉම "ලිඛිත පර්යේෂණ නිබන්ධනයක්" යන්න වෙනුවට "සහතික පාඨමාලාව" ලෙස ඇතුළත් කර සංශෝධනය කරනු ලැබේ.</td></tr>
<tr><td>5</td><td>පස්වැනි පරිශිෂ්ඨය</td><td>පස්වැනි පරිශිෂ්ඨය<br>3 වන කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා නිලධාරීන් විසින් සම්පූර්ණ කළ යුතු සුදුසුකම් -<br>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් හෝ කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කරනු ලබන වෙනත් ආයතනයක් විසින් පවත්වනු ලබන ධාරිතා සංවර්ධනය පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර සහතික පත්‍රය ලබා ගැනීම.</td></tr>
</table>

02 - 493

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.